**හක්මන ප්‍රාදේශීය සභාව - 2020**

**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------**

**1.1. තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

හක්මන ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට හක්මන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**---------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පතනේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයහිමියන් යටතේ රු.864,288ක වැඩිපුර ප්‍රතිපාදන සලස්වා තිබුණි. | 2021 ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ලැබුණු ප්‍රාග්ධන ආධාර රු.2,586,690ක් සහා පොදු ජංගම ගිණුමේ තැන්පත් කිරීම නිවැරදි කිරීමට සදොස් ලෙස රු.2,586,690ක් ප්‍රාග්ධන ආධාර ගිණුමට හර කිරීම හේතුවෙන් ප්‍රාග්ධන ආධාර ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අදාල ලේඛන අනුව ගිණුම්ගත කර ඇති බව. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | 2017 වර්ෂය වෙනුවෙන් ලැබුණු උසාවි දඩ රු. 90,669 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ මුදල ලෙස ගිණුම්ගත කර තිබුණි. | | |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගිණුම් විෂයයන් 10 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු .92,573,173 ක් හා උපයෝගී ලේඛන උපලේඛන/, වාර්තා අනුව වටිනාකම රු.75,680,234 ක් වූයෙන් රු.16,892,939 ක වෙනසක් විය . | වෙනස්කම් සොයා බලා ඉදිරි වර්ෂවලදී නිවැරදි කරන බව. | අදාල ශේෂ වල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

### 1.6.3 අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2010 වර්ෂයේ සිට ඉදිරියට එමින් පැවති රු.873,211 ක අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව. | ඒ පිළිබඳව සොයා බලා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කර අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.24,331,838 ක් වූ ගිණුම් විෂයයන් 09 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරික්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම්ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.9,012,717 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.11,933,283 ක් විය.

**2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**2.2.1 වරිපනම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,063,212 ක් හිඟව පැවතුණි. | ජංගම සේවයක් පවත්වා හිඟ මුදල් දායක කිරිමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

**2.2.2 කඩකුලී**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට රු.561,012 ක් කඩකුලී හිඟව පැවතුණි. | ඉදිරියේදී අය කිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 ජනවාරි 12 වන විට ව්‍යාපාර ආයතන 60 ක් සඳහා පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි. ඒ සඳහා බලපත්‍ර ගාස්තු 264,000 ක් හා පෙරසැරි ගාස්තු රු.156,000 ක් අයවිය යුතුව තිබුණි. | ඉදිරියේදී බලපත්‍ර ලබා දීමට කටයුතු කරන බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සභා බල ප්‍රදේශය තුළ සවිකර තිබූ දැන්වීම් පුවරු 79 ක් වෙනුවෙන් රු.212,265 ක ගාස්තුවක් අයකරගෙන නොතිබූ අතර මෙම දැන්වීම් පුවරු කවදා සිට ප්‍රදර්ශනය කළේද යන්න ඒ පිළිබඳ සමීක්ෂණයක් මඟින් තහවුරු කරගෙන නොතිබුණි. | ප්‍රවර්තන වර්ෂයේදී නිවැරදි කරන බව. | |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශයේ දුරකථන සමාගම් 04 ක් විසින් 2020 දෙසැම්බර් 31 දිනට ස්ථාපිත කර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 04 ක් වෙනුවෙන් ව්‍යාපාර බදු අයකරගෙන නොතිබුණි. | ඉදිරියේදී ගාස්තු අය කිරිමට කටයුතු කරන බව. | උපදෙස් ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ අනවසර ඉදිකිරීම් 20 ක් වාර්තා වී තිබුණද විගණන දිනය වූ 2021 ජනවාරි 12 වන දිනය වන විටත් ඉන් 19 ක් සම්බන්ධයෙන් අනවසර ඉදිකිරීම් පිළිබඳ නිවේදන පමණක් අදාළ පාර්ශවයන්ට නිකුත් කර තිබුණි. | නඩු පැවරීමට නීති උපදෙස් ලැබී නොමැති බවත්, උපදෙස් ලද පසු සභා අනුමැතිය ගෙන ඉදිරි කටයුතු කරන බව. | කඩිනමින් අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතුය. |